# මහජන නියෝජිතයෙක් ලෙස තේරීපත්වීමට සිටින ඔබට ගංජා, හෙරොයින් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කර රට සීඝ්‍ර සංවර්ධනයක් කරා යොමු කළ හැක්කේ කෙසේද?



මෙවර මහමැතිවරණයට මැතිවරණ අපේක්ෂකයෙකු ලෙස තරග කරන ඔබ සහ ඔබගේ දේශපාලන පක්ෂය මගින් ගංජා, හෙරොයින් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාදැයි මහජනතාවට ඉදිරිපත් කිරීමට දැන් අවස්ථාව සැලසී ඇත.

## ගංජා ගැන ඔබ දැන ගත යුත්තේ..

Cannabis, Marjuana, weed, kg, ගංජා නොහොත් කංසා භාවිතයෙන් දැනට පවතින මානසික රෝග උග්‍ර වීමේ සහ නව මානසික රෝග ඇතිවීමේ අවදානම වැඩිකරවන බව ලොව පුරා විශේෂඥයන් විසින් අද වනවිට පෙන්වා දී ඇත.

### ගංජා භාවිතය නිසා ඇතිවන මානසික රෝග අතර

1. Cannabis Induced Psychosis
2. සයිකෝසියාව ගණයේ Schizophrenia
3. Bipolar Disorder
4. Depression

### මීට අමතරව

- මලානික ස්වභාවය
- තරුණ බව සීඝ්‍රයෙන් වියැකී යාම.
- ලිංගික අප්‍රාණිකත්වය
- පිළිකා
- හෘදයාබාධ
- අංශභාගය වැනි රෝග ඇති වන බව සොයාගෙන තිබේ.



සත්‍ය තත්වය ඉහත සඳහන් ආකාරයේ වුවත් ගංජා නීතිගත කිරීමේ ජාවාරමේ නිරත කණ්ඩායම් සත්‍ය තත්වය වසන් කරමින් ගංජා භාවිතය වාසිසහගත එකක් බව හුවාදැක්වීමට විවිධ මත පතුරුවමින් සිටී. ඒවා නම්, පුද්ගල නිර්මාණශීලීත්වය ඉහළ නංවන බව, පුද්ගලයාට අධ්‍යාත්මික සුවයක් ලැබෙන බව, සෞඛ්‍යයට කිසිදු හානියක් නොවන බව, පුද්ගල තැන්පත් ස්වභාවය ඇති වන බව නිතර අසන්නට ලැබේ.

මෙවැනි පදනම් විරහිත මතවාද පැතිරීමට ජාවාරම්කරුවන් විසින් ඇතැම් මාධ්‍යවේදීන්, කලාකරුවන්, දේශීය වෛද්‍යවරුන් යොදාගනිමින් ළමා පරපුර, තරුණ පරපුර සහ පොදු මහජනතාව නොමග යවමින් සිටියි.

### ගංජා නීතිගත කිරීමට පිටුපස සිටින අදිසි හස්ත

මේ වන විට ගංජා භාවිතය නීතිගත කිරීම සඳහා විශාල ජාවාරමක් ලංකාව තුළ මෙන් ම ලොව පුරා ද ක්‍රියාත්මක වේ. එකී ක්‍රියාවලියට අවශ්‍ය වටපිටාව සකස් කරගැනීම සඳහා විවිධ කණ්ඩායම් විවිධ උත්සහයන්හි යෙදෙන බව පෙනී යයි.

ඒ සඳහා ඔවුන් පහත සඳහන් ආකාරයෙන් උත්සහ කරයි.



- ෆේස්බුක් සහ අනෙකුත් සමාජ වෙබ් අඩවි උපයෝගී කර ගැනීම.
- සමාජය තුළ නව සංවාද කතිකා ඇති කිරීමට උත්සහ දැරීම.
- පුවතපත් තුළ ලිපි පළ කිරීම.
- ගංජා සම්බන්ධ පොත්පත් එළිදැක්වීම.
- එළිදැක්වූ පොත් දේශපාලනඥයන් හමුවෙමින් ඔවුන්ට පිළිගැන්වීම.
- ගංජා පිළිබඳව කතාකිරීමට මාධ්‍ය තුළ අවස්ථා ඇති කරගැනීම.

අද වනවිට ලෝකයේ නීතිගත ගංජා ව්‍යාපාරයෙන් බහුතර ප්‍රමාණයක් බහුජාතික දුම්කොළ සමාගම් මිලදී ගෙන ඇති අතර ගංජා නීතිගත කිරීමේ ව්‍යාපාරයට මෙතරම් මුදලක් පොම්ප කර සිටින්නේ දුම්කොළ සමාගම බව පැහැදිලිව ම පෙනී යයි. ඒවා අතර බ්‍රිතාන්‍ය ඇමරිකානු දුම්කොළ සමාගම, මල්බරෝ දුම්කොළ සමාගම ප්‍රමුඛත්වය ගෙන සිටියි.

## ගංජා භාවිතය ප්‍රචලිත කිරීමේ උගුලෙන් රටත්, මහජනතාවත් බේරාගැනීමට මහජන නියෝජිතයෙක් ලෙස ඔබට ක්‍රියාත්මක විය හැක්කේ කෙසේද?

1. ගංජා නීතිගත කිරීමේ උගුලෙන් රට ගලවා ගැනීම සහ ඊට එරෙහි ව සෑමවිට ම නැගී සිටීම.
2. දැනට පවතින නීතිරීති සහ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කිරීම.
3. ගංජා භාවිතය ප්‍රවර්ධනය කරන විවිධ ආකාරයේ මාධ්‍යයට එරෙහිව කටයුතු කිරීමට අවශ්‍ය නව පනත් සම්මත කිරීම සහ බලාත්මක කිරීම.
4. දැනට ගංජා භාවිතයට හසුව සිටින්නන් ඉන් නිදහස් කිරීමට අවශ්‍ය නිසි ප්‍රතිකාර ක්‍රමවේදයන්ට යොමු කිරීම.
5. ගංජා භාවිතයේ ඇති හානිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.
6. දැනට ගංජා ජාවාරම පිළිබඳ හෙළිවන තොරතුරු වසං නොකර ජනතාව වෙත ඉදිරිපත් කිරීම.

## හෙරොයින් භාවිතයට යොමුවීම වැලැක්වීම සහ හසුවී ඇති අය නිදහස් කරගැනීමට ක්‍රියාත්මක විය යුත්තේ ඇයි?

**හෙරොයින් යනු,**

පුද්ගලයා අවපීඩනයට ලක්කරන මත්ද්‍රව්‍යයකි. හෙරොයින් භාවිතයෙන් පසු ශරීරයට වෙහෙසකර බවින් යුතු අපහසුතාවක් දනවන රසායනික සංඝටක අන්තර්ගත බව විද්‍යාත්මකව තහවුරු වී ඇත.

හෙරොයින් භාවිතය අවම කිරීමට මහජන නියෝජිතයෙක් ලෙස ඔබේ වගකීම..

1. දැනට හෙරොයින් ජාවාරම පිළිබඳ හෙළිවන තොරතුරු වසං නොකර ජනතාව වෙත ඉදිරිපත් කිරීම.
2. දැනට පවත්නා නීතිරීති සහ ප්‍රතිපත්ති බලාත්මක කර ක්‍රියාත්මක කිරීම.
3. පාට පක්ෂ භේදයකින් තොරව ජාවාරමට සම්බන්ධ දේශපාලනඥයින් හෙළිකිරීම.
4. දැනට හෙරොයින් භාවිතයට යොමුව සිටින්නන් ඉන් නිදහස් කිරීමට විද්‍යානුකූල නිසි ප්‍රතිකාර ක්‍රමවේදයන්ට යොමුකිරීම.
5. පුනුරුත්ථාපන මධ්‍යස්ථාන තුළ පුද්ගල හැකියා වර්ධනයට අවශ්‍ය ස්වයං රැකියා සහ නව කර්මාන්ත සඳහා මගපෙන්වීම.

## ගංජා, හෙරොයින් සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම තුළින්,

1. ආර්ථිකය ශක්තිමත් වීම.
2. මත්ද්‍රව්‍ය තුළින් ඇති වන රෝගාබාධ නිවාරණය සඳහා සෞඛ්‍ය අංශය වියදම් කරන මුදල අවම වීම.
3. ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය වීම.
4. සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලාංකිකයින් පිරිසක් නිර්මාණය වීම රටකට දිනාගත හැකි ප්‍රතිලාභයි.

ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලාංකිකයන් ජාවාරම්කරුවන්ගෙන් නිදහස්කොට සෞඛ්‍යසම්පන්න දිවිපෙවතක් කරා ළඟා කරවීමේ වගකීම ඔබ සතුව පවතී.



**මෙවර මහමැතිවරණයට මැතිවරණ අපේක්ෂකයෙකු ලෙස තරග කරන ඔබ සහ ඔබගේ දේශපාලන පක්ෂය ගංජා, හෙරොයින් ඇතුළු අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාදැයි මහජනතාවට පැහැදිලි කිරීම අතිශයින් වැදගත් වන්නේ, මෙම කරුණු මත තීරණ ගන්නා සැළකිය යුතු ඡන්ද දායකයින් ප්‍රමාණයක් මෙම කරුණු සම්බන්ධයෙන් ඔබගේ ස්ථාවරය කුමක්දැයි විමසිල්ලෙන් බලා සිටින බැවිනි.**

**වැඩිදුර විස්තර සඳහා පහත මූලාශ්‍ර භාවිත කරන්න.**


http://www.thelancet.com/journals/lanpsy/article/PIIS2215-0366(19)30048-3/fulltext

http://learnaboutsam.org/we-won-the-flight-in-minnesota/

http://www.forbes.com/sites/sarabrittanysomerset/2018/12/04/possible-big-tobacco-deal-causes-cronos-stock-to-soar/#361528a04891

http://learnaboutsam.org/colorado-2/

http://www.medscape.com/viewarticle/910863?nild=129026_2163&src=WNL_mdplsnews_190329_mscpedit_gast&uacv=215020CT&spon=20&impID=1922219&faf=1



මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org